′

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1914/2 - 2015 මැයි මස 11 වැනි සඳුදා - 2015.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනයයි

1985 අංක 48 දරන පනතින් හා 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4(3), 14 සහ 20 වැනි වගන්තියෙන් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවන ලද පහතින් දැක්වෙන *ගැසට් නිවේදනයන්හි* සඳහන් රෙගුලාසි පාර්ලිමේන්තුවේ සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. පී. වෙල්ලප්පිලි,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

2015 මාර්තු මස 02 වැනි දා,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ සම්මත කිරීම

1. ආනයන හා අපනයන පාලන බලපත්‍රය හා ඊට අදාළ හර පත්‍රය නව සංශෝධනයන්ට ලක් කරමින් නිකුත් කරන ලද 2014.07.21 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1872/5, 2014.09.10 වැනි දින පාර්ලිමේන්තුවේ දී සම්මත වූ බව ;

2. ඛණිජතෙල් නිෂ්පාදන යටතේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන්යානා තෙල් සහ තාර සම්බන්ධයෙන් ආනයන බලපත්‍ර ගාස්තු සංශෝධනයට ලක් කරමින් නිකුත් කරන ලද 2014.09.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1882/5, 2014.11.24 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

3. සංයෝජිත වර්ගීකරණය සංකේතාංක 03.02, 03.02.89, 03.03 හා 03.03.89 ශ්‍රී ලංකාව තුළට ලින්නා මසුන් ආනයනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමින් නිකුත් කරන ලද 2014.10.02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1882/40, 2014.11.24 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

4. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0701.90 යටතේ අළුත් හෝ ශීත කළ අර්තාපල් ආනයනය අත්හිටුවමින් නිකුත් කරන ලද 2014.10.10 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1883/16, 2014.11.24 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

5. ඇතැම් මෝටර් රථ සම්බන්ධයෙන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංශෝධනයට ලක් කරමින් නිකුත් කරන ලද 2014.10.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1885/50, 2014.11.24 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

05 - 642